
www.kelumweligama.lk
කැලුම්
වැලිගම
Author | ICF Certified Coach | Corporate Trainer

වේගයෙන් අලෙවි වන පුද්ගල සංවර්ධන කෘති පෙළක් වන "ජීවිතය වෙනස් කරන කතා" කෘති පෙළ රචනා කළ කැලුම් වැලිගම පුද්ගල සංවර්ධනය, නායකත්වය, අභිප්‍රේරණය, මනෝවිද්‍යාව, නියුරෝන විද්‍යාව, අලෙවිකරණය, සන්නාමකරණය, ආයතනික සවිඥාණකත්වය සහ ව්‍යවසායකත්වයට අදාල නවීනතම දැනුම් සම්භාරයක් ප්‍රායෝගික ආරකින් ශ්‍රී ලාංකිකයන් වෙත තිළිණ කළ ලේඛකයෙක්, කළමනාකරණ උපදේශකයෙක්, අභිප්‍රේරකයෙක් සහ පුද්ගල සංවර්ධන දේශකයෙකි.

ඔහු රචනා කළ ජීවිතය වෙනස් කරන කතා 1, ජීවිතය වෙනස් කරන කතා 2, ජීවිතය වෙනස් කරන කතා 3, ජීවිතය වෙනස් කරන කතා 4, මහමොළකාරයෝ, තරඟයේ වීරයා, ෂර්ලොක් හෝම්ස් වගේ හිතන්නේ කොහොමද, ඉරණම වෙනස් කිරීමේ කලාව, විශිෂ්ට පියවර සහ පර්සෝනා ආදී කෘතීන් මේ වන විට පිටපත් 150,000කට වැඩි ප්‍රමාණයක් අලෙවි වී ඇත. විවිධ ජාතික පුවත්පත්, සඟරා, ගුවන් විදුලි සහ රූපවාහිණී නාලිකා ඔස්සේ කැලුම් වැලිගම පාඨකයන්ට නිරන්තරයෙන් සමීප වෙයි.

මහනුවර ධර්මරාජ විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙක් වන කැලුම් වැලිගම කැලණිය විශ්වවිද්‍යාලයෙන් වානිජවේදි විශේෂ උපාධිය ලැබුවේය. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයෙන් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය ආයතනයෙන් ගිණුම්කරණය සහ මුල්‍ය කළමනාකරණය පිළිබඳ දැනුම සහ පරිචය ලබාගත් ඔහු එංගලන්ත වරලත් අලෙවිකරණ ආයතනයෙන් (CIM, UK) අලෙවිකරණය සම්බන්ධ දැනුම සහ පරිචය ලබා ගත්තේය. මානව හැකියා පුහුණුව සහ සංවර්ධනය පිළිබඳව උසස් ජාතික ඩිප්ලෝමාධාරියෙක් වන ඔහු මනෝවිද්‍යාව, නියුරෝන විද්‍යාව සහ නියුරෝන වාග් ක්‍රමවේදය (NLP) පිළිබඳ දෙස් විදෙස් පුහුණුව සහ අධ්‍යයනය ලබා ඇත. එසේම International Coach Federation මගින් සහතිකලත් පුහුණුකරුවෙක්ද වෙයි.



ශ්‍රී ලංකා පුහුණු සහ සංවර්ධන ආයතනයේ විධායක සභාවේ හිටපු සාමාජිකයෙකු සේම කැළණිය විශ්වවිද්‍යාලයේ විභවතා සංවර්ධනය පිළිබඳ බාහිර කතිකාචාර්යවරයෙක්ද වන කැලුම් වැලිගම MAS හෝල්ඩින්ග්ස්, Brandix, Colombo Dockyard, අබාන්ස්, NSB බැංකුව, යූනියන් ඇෂුවරන්ස්, මහජන බැංකුව, සිරස රූපවාහිනිය, දෙරණ රූපවාහිනිය, කැම්සෝ ලෝඩ්ස්ටාර්, ෆොන්ටෙරා, ක්‍රිස්ටල් මාර්ටින්, නෝර්ත් සේල්ස්, මහවැලි අධිකාරිය, DSI, KEELS, Elephant House, රයිගම් සමාගම, නිත්‍යකල්‍යාණි ජුවලරීස්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, AIA රක්ෂණ සමාගම, HNB ඇෂුවරන්ස්, ESOFT , NIBM, SIEGIS කැම්පස්, SIBA කැම්පස්, SAGT Colombo, සිලෝන් නිව්ස් පේපර්ස්, කැලණිය විශ්වවිද්‍යාලය, වයඹ විශ්වවිද්‍යාලය, රජරට විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය, කොළඹ රාජකීය විද්‍යාල ක්‍රිකට් කණ්ඩායම ඇතුළු ආයතන සහ සමාගම් රැසකට පුද්ගල සංවර්ධන වැඩමුළු සහ දේශන 500කට අධික ප්‍රමාණයක් සාර්ථකව පවත්වා ඇත.

**කැලුම් වැලිගම**

පුද්ගල සංවර්ධන දේශක සහ ලේඛක

# අපගේ පුහුණු සහ සංවර්ධන තේමාවන්

- කාර්ය සාධන කළමනාකරණය
- විකුණුම් විශිෂ්ටත්වය
- සන්නාම සංවර්ධනය
- අලෙවිකරණ සහ සේවා විශිෂ්ටත්වය
- නිර්මාණාත්මක චින්තනය
- අභිප්‍රේරණය සහ ධනාත්මක චින්තනය
- විශිෂ්ට තීරණ ගැනීම සහ ගැටළු විසඳීම
- පාරිභෝගික සත්කාරක කුසලතා සංවර්ධනය
- නායකත්ව සංවර්ධනය
- වාග් නියුරෝන ක්‍රමවේදය
- සංනිවේදන කුසලතා සංවර්ධනය
- කණ්ඩායම් සංවර්ධනය
- නියුරෝසෙලින්
- කාන්තා සවි බලගැන්වීම

# අපගේ විශිෂ්ට ගණුදෙනුකරුවන්

අපි ගණුදෙනුකරුවන් තෘප්තිමත් කිරීමෙන් සෑහීමකට පත්නොවී ඔවුන් විශිෂ්ටත්වයට පත්කරන්න කැපවී සිටින්නෙමු.

| | | | | |
|---|---|---|---|---|
| Abans | AIA | | brandix inspired solutions | BANK OF CEYLON BOC Bankers to the Nation |
| BONFIRE SRI LANKA | CAMSO ROAD FREE COMPANY | COLOMBO DOCKYARD | COOL TEMPO (Pvt)Ltd. | CRYSTAL GROUP |
| දෙරණ | | DSI Tyres | Elephant House | English Tea Shop ORGANIC |
| ESOFT Esoft Metro Campus | Finlays Since 1750 | Fonterra | greentel mobile | Hero |
| HNB ASSURANCE | HumanX HR management in a box | CISIR Industrial Technology Institute | Imperial College of Business Studies | JMC Jayasekera Management Centre (Pvt) Ltd. Colombo 02. Estd. 1972 |
| KEELLS Food Products PLC | LALAN Since 1940 | Lanka EXPRESS | ලංවා | MAS CHANGE IS COURAGE |

| | | | | |
|---|---|---|---|---|
| MAS ACTIVE<br>Linea Intimo | | මව්බිම | M.D.GUNASENA | MINSARA<br>The Journey Of Knowledge |
| National Blood Transfusion Service<br>Sri Lanka | NIBM<br>BUILDING COMPETENCIES | National Institute of Mental Health<br>To Lead the Nation in Mental Health Care | Wellawatta Nithyakalyani Jewellery | NORTH SAILS |
| NSB<br>National Savings Bank | ORANGE<br>ELECTRIC | PEOPLE'S BANK<br>The Bank of the People | Raigam | ROOFMART |
| saegis campus | SAGT<br>PORT OF COLOMBO SRI LANKA | සණස | SELACINE | TV |
| SLIC<br>Sri Lanka Insurance | | | ASIA Siyaka | SRI LANKA INSTITUTE OF TRAINING AND DEVELOPMENT<br>SLITAD<br>ESTD.1998 |
| STAR<br>A Komar company | UNION ASSURANCE<br>A JOHN KEELLS COMPANY | | VT Solutions<br>www.vt-solutions.com | WIJAYA<br>Holiday Resort |











































## 500ට වැඩි පුහුණු සැසි දිවයින පුරා සාර්ථකව සිදුකර ඇත











# ජීවිතය
## වෙනස් කරන කතා 1
Inspirational Stories for Life



# ජීවිතය
## වෙනස් කරන කතා 2
Inspirational Stories for Life




# ජීවිතය
## වෙනස් කරන කතා 3
Inspirational Stories for Life



# ජීවිතය
## වෙනස් කරන කතා 4
Inspirational Stories for Life




# මහමොළකාරයෝ
විශිෂ්ට ව්‍යාපාරිකයන්ගේ අති සාර්ථකත්වයේ රහස්



# තරඟයේ වීරයා
MAN OF THE MATCH


ජීවන ක්‍රීඩාවෙන් විශිෂ්ටව දිනන්න මග පෙන්වන



# පර්සෝනා



# ෂර්ලොක් හෝම්ස්වගේ හිතන්නේ කොහොමද?



# ඉරණම වෙනස් කිරීමේ කලාව



Talents හදන වැඩ බිම

# විශිෂ්ට පියවර

# කැලුම් වැලිගම විසින් රචිත කෘති පිළිබඳව ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් දැක්වූ අදහස් කිහිපයක්

“කැලුම්ගේ තරගයේ වීරයා කෘතියේ එක් තැනක ෆ්‍රැන්සිස් බේකන්ගේ කියමනක් උපුටා දක්වමින් විකා ජීර්ණය කර ගත යුතු පොත් ගැන පාඨකයාට මතක් කරදෙයි. සැබැවින්ම මෙම කෘතියද අයත් වෙන්නේ එලෙස නැවත නැවත කියවා, එම අන්තර්ගතයන් ජීවිතයට එකතු කර ගනිමින් ජීවිතය වෙනස් කරගන්නට සුදුසු  පොත් ගොන්නටයි.”

**දීපාල් සූරියආරච්චි -  කළමනාකරණ උපදේශක, ලේඛක, දේශක**

“සරල දේවල් සංකීර්ණ කරලා නොතේරෙන භාෂාවෙන් ලියන පණ්ඩිතයන්ට කැලුම් වැලිගම හොඳ අභියෝගයක්. ක්‍රීඩාවෙන්, කලාවෙන්, දේශීය තරුවලින්, ව්‍යාපාර ලෝකයෙන්, ගමෙන්, ගමේ නිර්මල කොල්ලන්ගෙන් කෙල්ලන්ගෙන් සහ අපේම සංස්කෘතියෙන් උකහා ගත් උදාහරණ ලෝක ප්‍රසිද්ධ චරිත සහ සිද්ධි සමඟ අපූරුවට සංකලනය කරලා, තර්ක කරලා මාර් ගෝපදේශනය සැපයීම කැලුම් වැලිගමගේ ලේඛන හැකියාවේ මම දකින විශේෂත්වයක්. ඔහු අද යුගයට ගැලපෙන දක්ෂයෙක්. තරගයේ වීරයා සැබැවින්ම සාර්ථකයි. මම කියෙව්වා අසාවෙන්, ඉගෙනගත්තා උනන්දුවෙන්, රසිකයෙක් වුණා මම ඔහුගේ.”

**කිෂු ගෝමස් - කළමනාකරණ අධ්‍යක්ෂ - Dreamron සමූහ ව්‍යාපාරය**

“ජීවිතය ඔහේ ගමන් ගන්නක් නොවේ. ජයග්‍රහණය පිළිබඳ අදහසක් ඇති කර ගැනීමට නම් පරාජය පිළිබඳවත් යම් අවබෝධයක් තිබිය යුතුයි. පෘථිවියේ අන් සෑම සත්ත්ව වර්ගයකටම වඩා මිනිසා විශේෂ වෙයි. ඒ ඔහුගේ සිතිවිලි ක්‍රියාත්මක කිරීමේ පොහොසත්කම නිසයි. ඒ නිසාම සිතිවිලි ධාරාවන්ට ඔහේ ක්‍රියාත්මකවීමට ඉඩදිය යුතු නොවේ. ඒවා ජයග්‍රහණයේ මාර්ග කරා හැසිරවිය යුත්තේ මිනිසා නම් වූ වරප්‍රසාදයේ අගය තේරුම් ගනිමින්ය. තරගයේ වීරයා නම් මෙම අගනා කෘතිය ඒ මග තේරුම් කර ගැනීමට පැහැදිලි මර්ග සංඥා සපයයි.”

**මහින්ද ප්‍රසාද් මස්ඉඹුල - සම්මානලාභී ලේඛක**

“තමාගේ ජීවිතය වඩාත් යහපත් සහ ආදර්ශවත් ලෙස වෙනස් කර ගැනීමත්, ඒ වෙනස තුළින් සමස්ත ලෝකයට ආදරය, කරුණාව සහ දායාව දක්වමින් සේවය කිරීමත් උතුම් ගුණයකි. ලෝකය වේගයෙන් සංවර්ධනය කරා දුවද්දී සොබා දහම, සතුන් සහ මිනිසුන් අමතක කර තිබීම කණගාටුවට කරුණකි. අපි සැවොම එක්ව මෙම ක්‍රමය වෙනස් කළ යුතුය. සොබාදහම, සතුන් සහ මානුෂීය ගුණාංගවලින් පිරුණු මිනිසුන් නොමැති තැන වේගවත් සංවර්ධනයකින් පමණක් ප්‍රතිඵලයක් නොලැබේ. කැලුම් වැලිගම විසින් ලියන ලද “ජීවිතය වෙනස් කරන කතා” කෘතියද මානව හිතවාදී අයුරින් අපේ සමාජය යහපත් වෙනසකට යොමු කිරීමට දායකත්වය දක්වනු ඇතැයි මම විශ්වාස කරමි.”

**ඔටාරා ඩෙල් ගුණවර්ධන - ඔඩෙල් සහ එම්බාර්ක් නිර්මාතෘවරිය**

"තරඟයේ වීරයා කෘතිය කියවීමට කාලය ගත කිරීම රසවත් මෙන්ම හරවත් අත්දැකීමක් යැයි මම විශ්වාස කරනවා. සමාව නොදෙන තරඟකාරී ව්‍යාපාරික ලෝකයක සාර්ථක වීමේ යථාර්ථය මෙතරම් සාර්ථක කතාන්දර මිශ්‍රණයක් ඔස්සේ ගෙන ඒම විශාල ජයග්‍රහණයක් බව මගේ අදහසයි. වෙහෙස මහන්සි වී වැඩ කිරීම, කැපවීම සහ සියල්ලටම වඩා තමා කෙරෙහි ඇති අචල විශ්වාසය සාර්ථකත්වයේ යතුර බව මෙම අගනා කෘතියෙන් කියවෙන ප්‍රමුඛ පණිවුඩයයි. කැළුම් වැලිගම ඔබගේ පොත කියවීමට ලැබීම මට ගෞරවයක්."

**ඩස්ටි අලහාකෝන් - සභාපති Next Campus, හිටපු ප්‍රධාන විකුණුම් සහ අලෙවි ප්‍රධානි - කොකා කෝලා ශ්‍රී ලංකා**

"කාර්ය බහුල ජීවිතය තුළ ඉඩක් ලද සෑම විටකම ඉතා ආශාවෙන් පිටුවෙන් පිටුව, ඡේදයෙන් ඡේදය කියවමින් මුල සිට අග දක්වාම කියවා අවසන් කළෙමි. පොත පුරා ඇස ගිය රස තැන් බොහෝ දුටිමි. එම සෑම කරුණක්ම ඉතා අගනා යමක් ජීවිතයට එකතු කරයි. තරගයේ වීරයා කෘතිය තුළ අඩංගු කරුණු උදාහරණ සහිතව තහවුරු කරමින් ඉදිරිපත් කර ඇති නිසා එකී කරුණුවල ශක්තිමත් භාවය වැඩි වී තිබේ. එය පාඨකයාගේ ජිවිතය සාර්ථක කරගැනීමට හොඳ උත්තේජකයක් සපයයි."

**සඳමිණි පෙරේරා - උප සභාපතිනි ප්‍රයිම් ලෑන්ඩ් ව්‍යාපාර සමූහය, 2015 වසරේ විශිෂ්ටතම ව්‍යාපාරික කාන්තාව**

"අපූර්ව කියන පදය යොදන්නේ පූර්වයේ සිදු නොවූ, නොදුටු යමක් ගැන කතා කරනකොට. කැලුම්ගේ තරගයේ වීරයා කෘතියත් වැටෙන්නේ අන්න ඒ අපූර්ව ගණයට. ඕනෑම තරාතිරමක කෙනෙක් කියවිය යුතු අළුත් පොතක්. ඇත්තටම හරිම අපුරු පොතක්."

**අතුල කුඩාගමගේ - සාමාන්‍යාධිකාරී - ජෙනරල් සේල්ස් සමාගම, ප්‍රවීණ ලේඛක සහ දේශක**

"තම ජීවිතයේ සිහින යථාර්තයක් බවට පත්කර ගැනිමට වෙර දරන දිරිය මිනිසුන්ට කැලුම්ගේ කෘති මහඟු අත්වැලක් සපයයි."

**එස්. චමිල තුෂාර - ජ්‍යෙෂ්ඨ කථිකචාර්ය - කැලණිය විශ්වවිද්‍යාලය**

"ජීවිතය වෙනස් කරන කතා කෘතිය ඔස්සේ කැලුම් වැලිගම පාඨකයාගේ සිත් තුළ ඇති කරන අධ්‍යාත්මික වර්ධනය අති විශිෂ්ටයි. මම නැවත නැවතත් කියවන්න කැමති අගනා පොතක්."

**සනත් ගුණතිලක - ප්‍රවීණ සිනමා නළු**

"ජීවිතය වෙනස් කරන කතා කෘතිය ඔස්සේ කැලුම් වැලිගම පාඨකයාගේ සිත් තුළ ඇති කරන අධ්‍යාත්මික වර්ධනය අති විශිෂ්ටයි. මම නැවත නැවතත් කියන්න කැමති විශිෂ්ට පොතක්."

**සනත් ගමගේ - මානව සම්පත් පුහුණුකරු**



කැලුම් වැලිගම
163/ඒ/41, ඉන්ෆිනිටි, ජය මාවත,
අතුරුගිරිය.
(+94) 77 700 4186
(+94) 77 382 5510
kelumweligama@gmail.com
www.kelumweligama.lk
WATCH NOW
LEARN MORE